42933

AL/2019/32/S-II(NEW)

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved

නව නිර්දේශය / புதிய பாடத்திட்டம் / New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2019 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2019 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2019

ව්‍යාපාර අධ්‍යයනය II
வணிகக் கல்வி II
Business Studies II

32 S II

2019.08.13 / 1300 - 1610

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

**උපදෙස්:**

※ එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න දෙක බැගින්වත් තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

## I කොටස

**1.** අනූෂා ජංගම දුරකථන සිල්ලරව අලෙවි කරන අතරම නව මාදිලියේ දුරකථන කවර (phone cover) නිර්මාණ කරන්නියක් ද වේ. නිර්මාණකරණය පිළිබඳව ඇය සතුව මනා දැනුමක් හා පළපුරුද්දක් වේ. ඇය තම අලෙවිය සහ ලාභය වර්ධනය කර ගැනීම සඳහා සාමාන්‍යයෙන් එම දුරකථන කවර සඳහා පහළ මිලක් නියම කරනු ලබයි. 2019 වර්ෂයේ මැද භාගය තුළ ඇගේ කවර විකුණුම් ප්‍රමාණය ඒකක 50 000 කට ළඟා වූ අතර ඒකක 20 000 විකුණා ඇත්තේ මංගත (online) ක්‍රමය තුළිනි. අනූෂා තම ව්‍යාපාරය පුළුල් කර ගැනීමේ උපායමාර්ග හඳුනාගැනීම සඳහා SWOT (ශ.දු.අ.ත) විශ්ලේෂණයෙහි යෙදෙමින් සිටියි.

(i) (අ) ඉහත සිද්ධි අධ්‍යයනයෙහි ඇතුළත් ප්‍රධාන ව්‍යාපාර ක්‍රියාකාරකම් දෙක විස්තර කරන්න.
(ආ) ඉහත ව්‍යාපාරයේ ප්‍රධාන අරමුණු දෙක මොනවා ද? (ලකුණු 04 යි)

(ii) දුරකථන කවර සඳහා ඉහළ ඉල්ලුමක් ඇති වීම කෙරෙහි බලපෑ හැකි සාධක **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(iii) මංගත වෙළෙඳාම තුළින් අනූෂාට ලබා ගත හැකි වාසි **දෙකක්** හා අවාසි දෙකක් පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(iv) (අ) ව්‍යාපාර සඳහා SWOT විශ්ලේෂණය නිසා ඇති වන වාසි **හතරක්** දක්වන්න.
(ආ) දුරකථන කවර කර්මාන්තය සඳහා පොදුවේ ඇති අවස්ථා **දෙකක්** හා තර්ජන දෙකක් ලියන්න. (ලකුණු 04 යි)

(v) අනූෂා සතුව ඇති ශක්තීන් **දෙකක්** සඳහන් කර, ඒවා ව්‍යාපාරයේ ඉදිරි සංවර්ධනයට කෙසේ යොදාගත හැකි දැයි පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)
(මුළු ලකුණු 20 යි)

**2.** (i) කළමනාකරුවකු විසින් ප්‍රකාශ කරන ලද්දේ සමාගමේ අරමුණු හා සමාගම කෙරෙහි උනන්දුවන පාර්ශ්වයන්ගේ අරමුණු අතර ගැටුම්කාරී බව කළමනාකරුවන් හට අභියෝගයක් බවයි. සමාගමක අරමුණු සහ කොටස්කරුවන්ගේ අරමුණු උදාහරණ ලෙස ගනිමින් මෙම ප්‍රකාශය විස්තර කරන්න. (ලකුණු 04 යි)

(ii) (අ) 'තිරසර සංවර්ධනය' යන්න පැහැදිලි කරන්න.
(ආ) ව්‍යාපාරික සංවිධානයකට තම පාරිභෝගිකයින් කෙරෙහි ඇති සමාජ වගකීම් **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(iii) ව්‍යාපාර ආචාරධර්ම පිළිපැදීම තුළින් ව්‍යාපාර සංවිධානයකට ලබා ගත හැකි ප්‍රතිලාභ **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

[ දෙවැනි පිටුව බලන්න.

(iv) (අ) ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය මගින් සුළු හා මධ්‍ය පරිමාණ ආයතන වෙත ලබා දෙන සේවා **හතරක්** සඳහන් කරන්න.

(ආ) ශ්‍රී ලංකා මහ බැංකුව මගින් මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා භාවිත කරනු ලබන ප්‍රතිපත්තිමය පොලී අනුපාත වර්ග **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 04 යි)

(v) පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අරමුණු **හතරක්** විස්තර කරන්න. (ලකුණු 04 යි)

(මුළු ලකුණු 20 යි)

3. (i) බේකරි නිෂ්පාදනයට අවශ්‍ය යෙදවුම් මිල ඉහළ යාම නිසා බේකරි හිමියකු හවුල් ව්‍යාපාරයක් පිහිටුවා අතිරේක ප්‍රාග්ධනය සපයා ගැනීමට තීරණය කරන ලදී. මෙම තීරණයෙහි ඇති වාසි **හතරක්** විස්තර කරන්න. (ලකුණු 04 යි)

(ii) සිරිමලී විසින් තම ප්‍රදේශයෙන් බහුලව ලබාගත හැකි කෙසෙල් කෙඳි භාවිත කර කාන්තා අත් බෑග්, හිස්වැසුම් හා වෙනත් විසිතුරු නිර්මාණ නිපදවීමේ ආයතනයක් රු. 50 000ක මුදලක් ආයෝජනය කර ආරම්භ කරන ලදි. ඇය විසින් තම ප්‍රදේශයේ රැකියා විරහිත තරුණියන් තිදෙනකුට එම නිෂ්පාදන පිළිබඳ පුහුණුවක් ලබාදීමෙන් අනතුරුව දෛනිකව රු. 800 බැගින් ගෙවීමේ පදනම මත සේවයට බඳවා ගන්නා ලදී. එසේ ම තම නිෂ්පාදන සංචාරක හෝටල් තුළ අලෙවි කිරීමට ද කටයුතු සිදු කරන ලදී. මෙම සිද්ධිය තුළ ඇති සමාජීය හා ආර්ථික ප්‍රතිලාභ මොනවා දැයි දක්වන්න. (ලකුණු 04 යි)

(iii) විශාල ආයතනයක් වීමෙන් ලැබෙන ප්‍රතිලාභ නොසලකා හරිමින් ඇතැම් ආයතන කුඩා ව්‍යාපාර ලෙසටම පවත්වා ගැනීමට අදහස් කරන්නේ ඇයි දැයි දැක්වීමට හේතු **හතරක්** විස්තර කරන්න. (ලකුණු 04 යි)

(iv) (අ) 'ක්ෂණික ප්‍රතිචාර කේත' (Quick Response Code) භාවිතය මගින් ව්‍යාපාරිකයකුට ලබා ගත හැකි වාසි **දෙකක්** දක්වන්න.

(ආ) විද්‍යුත් මුදල් පසුම්බිය (e-wallet) භාවිත කර ජංගම දුරකථනයකින් ගනුදෙනු සඳහා මුදල් ගෙවීමේ දී පුද්ගලයකු විසින් සපුරා තිබිය යුතු මූලික කරුණු **දෙකක්** දක්වන්න. (ලකුණු 04 යි)

(v) (අ) රාජ්‍ය දෙපාර්තමේන්තුවක ලක්ෂණ **හතරක්** සඳහන් කරන්න.

(ආ) රාජ්‍ය සංස්ථාවක් රාජ්‍ය දෙපාර්තමේන්තුවකින් වෙන් කර හඳුනා ගත හැකි ලක්ෂණ **දෙකක්** පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(මුළු ලකුණු 20 යි)

4. (i) විධිමත් හා අවිධිමත් මූල්‍ය සම්පාදන මාර්ගවලින් මුදල් ලබාගෙන තම ප්‍රදේශයේ කිරි නිෂ්පාදන මිලට ගෙන විකිණීමේ ආයතනයක් ආරම්භ කිරීමට ලක්ෂ්මී අදහස් කර සිටියි. අවිධිමත් මූල්‍ය සම්පාදන මාර්ගවලට වඩා විධිමත් මූල්‍ය සම්පාදන මාර්ග තුළින් ලක්ෂ්මීට ලබා ගත හැකි වාසි **හතරක්** විස්තර කරන්න. (ලකුණු 04 යි)

(ii) (අ) 'ධාරක චෙක්පත්', 'විධාන චෙක්පත්' හා සසඳන්න.

(ආ) 'සේව්‍ය වගකීම් රක්ෂණය' යන්න විස්තර කරන්න. (ලකුණු 04 යි)

(iii) ශ්‍රී ලංකාවේ දුම්රිය ප්‍රවාහන සේවයේ ඇති දුර්වලතා **හතරක්** සඳහන් කර, එම දුර්වලතා මගහරවා ගැනීමට විසඳුම් යෝජනා කරන්න. (ලකුණු 04 යි)

(iv) (අ) ව්‍යාපාර කටයුතු සඳහා සන්නිවේදනය වැදගත් වන ආකාර **හතරක්** සඳහන් කරන්න.

(ආ) වාචිකව පණිවුඩයක් සන්නිවේදනය කිරීමේ දී එම පණිවුඩය වෙනස් වීම කෙරෙහි බලපාන හේතු **හතරක්** දක්වන්න. (ලකුණු 04 යි)

(v) (අ) 'සාපේක්ෂ පිරිවැය වාසිය' යන්න විස්තර කරන්න.


(ආ) 'විද්‍යුත් ගෙවීම් ක්‍රම' යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 04 යි)

(මුළු ලකුණු 20 යි)

[ තුන්වැනි පිටුව බලන්න.

## II කොටස

**5.** (i) පහත දැක්වෙන්නේ සංවිධාන සටහනක කොටසකි.




(අ) 'සංවිධාන ව්‍යුහය' යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද?

(ආ) 'පාලන අවකාශය' යන්න පැහැදිලි කරමින් ඉහත දී ඇති සංවිධාන සටහන අනුව අලෙවි කළමනාකරුගේ පාලන අවකාශයේ තරම දක්වන්න. (ලකුණු 04 යි)

(ii) (අ) 'සහගාමී පාලනය' සහ 'පසු පෝෂණ පාලනය' යනුවෙන් අදහස් කරන්නේ කුමක් දැයි පැහැදිලි කරන්න.

(ආ) ව්‍යාපාර සංවිධානයකට පර්යේෂණය හා සංවර්ධනය වැදගත් වීමට හේතු **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(iii) පහත දැක්වෙන්නේ X Y සමාගමේ තොරතුරු කිහිපයකි.

| | අයවැයගත (රු.) | සත්‍ය (රු.) |
|---|---|---|
| විකුණුම් ආදායම | 3 000 | 2 750 |
| විකුණුම් පිරිවැය | 2 100 | 12 700 |

(අ) විකුණුම් ආදායම් විචලනය හා විකුණුම් පිරිවැය විචලනය ගණනය කරන්න.


(ආ) විකුණුම් ආදායම් විචලනය විය හැකි හේතු **දෙකක්** පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(iv) "මෝටර් රථ නිෂ්පාදනයේ දී වැඩි වශයෙන් යොදාගනුයේ ප්‍රවාහ නිෂ්පාදන ක්‍රමයයි." මෙම ක්‍රමය මෝටර් රථ නිෂ්පාදනය සඳහා භාවිත කිරීමෙන් ලැබෙන වාසි **හතරක්** සඳහන් කර, ඒවා පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(v) 'ක්‍රියාවලි පිරියත', 'නිෂ්පාදන පිරියත' හා සසඳන්න. (ලකුණු 04 යි)

(මුළු ලකුණු 20 යි)

**6.** (i) XYZ සමාගමේ රූපවාහිනී යන්ත්‍රවල තොග මට්ටම් පිළිබඳව ප්‍රස්තාර සටහනක් පහත දැක්වේ.




පහත දෑ ගණනය කරන්න.

(අ) චක්‍රීය කාලය

(ආ) යළි ඇණවුම් ප්‍රමාණය

(ඉ) ආරක්ෂිත තොගය

(ඊ) පොරොත්තු කාලය (ලකුණු 04 යි)

[ හතරවැනි පිටුව බලන්න.

(ii) ද්‍රව්‍ය ඵලදායීතාවය වර්ධනය කළ හැකි ආකාර **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(iii) (අ) 'වෙළෙඳපොළ ඛණ්ඩනය' යනු කුමක් ද?

(ආ) වෙළෙඳපොළ ඛණ්ඩනය විකුණුම් වර්ධනයට උදව් වන ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(iv) 'පාරිභෝගික වටිනාකම' හා 'පාරිභෝගික තෘප්තිය' අතර ඇති සම්බන්ධතාවය විස්තර කරන්න. (ලකුණු 04 යි)

(v) (අ) 'භාණ්ඩයක ජීවන චක්‍රය' (PLC) යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද?

(ආ) නිෂ්පාදකයකුට භාණ්ඩයක ජීවන චක්‍රය අවබෝධ කර ගැනීම තුළින් ලැබිය හැකි වාසි **දෙකක්** ලියන්න. (ලකුණු 04 යි)

(මුළු ලකුණු 20 යි)

7. (i) ව්‍යාපාර සංවිධානයක බාහිර මූල්‍ය සම්පාදන මාර්ග **දෙකක්** හා ඒවායේ සීමා **දෙකක්** පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(ii) (අ) ව්‍යාපාරික තීරණ කෙරෙහි ද්‍රවශීලතා අනුපාතවල වැදගත්කම විස්තර කරන්න.

(ආ) සමාගමක කොටස් මිල වැඩි වීම කෙරෙහි බලපාන සාධක **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(iii) (අ) දත්ත, තොරතුරු හා සංසන්දනය කරන්න.

(ආ) 'දැනුම් සේවකයින්' යන්න පැහැදිලි කර, එවැනි සේවකයින් සඳහා උදාහරණ **දෙකක්** සපයන්න. (ලකුණු 04 යි)

(iv) (අ) 'රැකියා විස්තරය' හා 'රැකියා පිරිවිතරය' අතර වෙනස්කම් **දෙකක්** දක්වන්න.

(ආ) සේවකයින් වෘත්තීය සමිතිවල සාමාජිකත්වය ලබා ගැනීමට හේතු **දෙකක්** ලියන්න. (ලකුණු 04 යි)

(v) ආයතනයකට අලෙවි සහකරුවන් බඳවා ගැනීම සඳහා පුවත්පත් දැන්වීමක් පළ කිරීමට තීරණය කරන ලදී. මෙසේ පුවත්පත් දැන්වීමක් මගින් අයදුම්කරුවන් ආකර්ශනය කර ගැනීමේ ඇති වාසි **දෙකක්** හා අවාසි දෙකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04 යි)

(මුළු ලකුණු 20 යි)

8. (i) (අ) "සම්මුඛ පරීක්ෂණ ක්‍රමය සේවකයින් තෝරාගැනීම සඳහා භාවිත කරන ජනප්‍රිය ක්‍රමයකි." මෙම ක්‍රමයේ ඇති සීමා දෙකක් විස්තර කරන්න.

(ආ) පරිවාස කාලය තුළ තමන් වෙත පවරන ලද රාජකාරි හා වගකීම් ඉටු කිරීමට අපොහොසත් සේවකයකුට විරුද්ධව කළමනාකරණයට ගත හැකි ක්‍රියාමාර්ග **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(ii) සංවිධානයක මුදල් ගලා යාම් පාලනය කළ හැකි ආකාර **හතරක්** යෝජනා කරන්න. (ලකුණු 04 යි)

(iii) (අ) සංවිධානයක් සඳහා තොරතුරු කළමනාකරණයේ ඇති වැදගත්කම කෙටියෙන් පැහැදිලි කරන්න.

(ආ) ව්‍යාපාරිකයකුට ව්‍යාපාර සැලැස්මක් වැදගත් වීමට හේතු **දෙකක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04 යි)

(iv) (අ) අලෙවි සැලැස්මක ඇතුළත් විය යුතු මූලිකාංග පැහැදිලි කරන්න.

(ආ) තරඟකාරිත්ව විශ්ලේෂණයේ දී අවධානය යොමු කළ යුතු සාධක **හතරක්** ලියන්න. (ලකුණු 04 යි)

(v) ඇස්තමේන්තුගත ව්‍යාපෘති පිරිවැය තුළ අඩංගු වන 'මෙහෙයුම් පෙර වියදම්' යන්න පැහැදිලි කර, ඒ සඳහා උදාහරණ **දෙකක්** ලියන්න. (ලකුණු 04 යි)

(මුළු ලකුණු 20 යි)

* * *

+94 71 800 8533 / +94 77 088 2228 WWW.PADANAMAPUBLICATION.LK

## I කොටස

1. අනුෂා ජංගම දූරකථන සිල්ලරව අලෙවි කරන අතරම නව මාදිලියේ දූරකථන කවර (phone cover) නිර්මාණ කරන්නියක් ද වේ. නිර්මාණකරණය පිළිබඳව ඇය සතුව මනා දැනුමක් හා පලපුරුද්දක් වේ. ඇය තම අලෙවිය සහ ලාභය වර්ධනය කර ගැනීම සඳහා සාමාන්‍යයෙන් එම දූරකථන කවර සඳහා පහළ මිලක් නියම කරනු ලබයි. 2019 වර්ෂයේ මැද භාගය තුළ ඇගේ කවර විකුණුම් ප්‍රමාණය ඒකක 50 000 කට ළඟා වූ අතර ඒකක 20 000 විකුණා ඇත්තේ මංගත (online) ක්‍රමය තුළිනි. අනුෂා තම ව්‍යාපාරය පුළුල් කර ගැනීමේ උපායමාර්ග හඳුනාගැනීම සඳහා SWOT (ශ.දු.අ.ත) විශ්ලේෂණයෙහි යෙදෙමින් සිටියි.

(i) (අ) ඉහත සිද්ධි අධ්‍යයනයෙහි ඇතුළත් ප්‍රධාන ව්‍යාපාර ක්‍රියාකාරකම් **දෙක** විස්තර කරන්න

අලෙවිකරණය — ජංගම දූරකථන අලෙවිය තුළින් මිනිස් අවශ්‍යතා හා වුවමනා පසුරාලීම

ii. නිර්මානකරණය — නිර්මානකරණය තුළින් සම්පත්වලට අගය එකතු කිරීම

*(ක්‍රියාකාරකම් 2 සඳහන් කිරීමට ලකුණු ½ x 2 = ලකුණු*

*(විස්තර කිරීමට ලකුණු ½ x 2 = ලකුණු*

(ආ) ඉහත ව්‍යාපාරයේ ප්‍රධාන අරමුණු **දෙක** මොනවා ද?

i. අලෙවිය වර්ධනය / විකුණුම් උපරිම කිරීම

ii. ලාභය වර්ධනය / ලාභය උපරිම කිරීම

*(අරමුණු 2 ට ලකුණු 1 x 2 = ලකුණු*

(ii) දූරකථන කවර සඳහා ඉහළ පිරිවැටුමක් ඇති වීම කෙරෙහි බලපෑ හැකි සාධක **හතරක්** සඳහන් කරන්න.

1. මෝස්තරය
2. නව්‍ය බව/ නව මාදිලිය
3. මිල මට්ටම අඩුවීම
4. පහසුවෙන් ලබා ගත හැකි බව / මංගත ක්‍රමයට ලබාගත හැකි වීම

*(කරුණු 4 ට ලකුණු 1x 4 = ලකුණු*

iii) **මාර්ගගත වෙළෙඳාම තුළින් අනුශාට ලබා ගත හැකි වාසි දෙකක් හා අවාසි දෙකක් පැහැදිලි කරන්න.**

**වාසි**

1. ඉහළ පාරිභෝගික පිරිසක් ලබා ගත හැකි වීම
2. වෙළඳපොල පුළුල් වීම
3. පිරිවැය අවම වීම
4. වෙළඳපොළට පහසුවෙන් ඇතුල්විය හැකි වීම/ ගෝලීය තරඟකාරීත්වයට පහසුවෙන් මුහුණ දිය හැකි වීම
5. පොදු කාර්යය පිරිවැය අවම වීම
6. අඩු සේවක සංඛ්‍යාවක් අවශ්‍ය වීම
7. දවසේ ඕනෑම වේලාවක ගනුදෙනු කළහැකි වීම
8. ගොඩනැගිලි ඉඩකඩ අවශ්‍ය නොවීම

9 කාලය ඉතුරු වීම

*(වාසි 2 ට ලකුණු 1x 2 = ලකුණු 02)*

**අවාසි**

1. වෙබ් පිටු නිර්මාණය සඳහා පිරිවැයක් දැරිය යුතුවීම
2. පාරිභෝගික විශ්වාසය අඩුවීම
3. ආරක්ෂාව පිළිබඳ ගැටළු
4. නෛතික ගැටළු ඇතිවීම
5. ගෙවීම් ක්‍රමවල ගැටළු ඇතිවිය හැකි වීම

6) තාක්ෂණික බිඳ වැටීම

*(අවාසි 2 ට ලකුණු 1x 2 = ලකුණු 02)*

(iv) (අ) ව්‍යාපාර සඳහා SWOT විශ්ලේෂණය නිසා ඇති වන වාසි **හතරක්** දක්වන්න.

1. ශක්තීන් අවධාරණය කර ගැනීමට
2. දුර්වලතා අවම කර ගැනීමට
3. අවස්ථා භාවිතයට ගැනීමට
4. තර්ජන සඳහා පෙර සූදානමක් ඇති කර ගැනීමට

*(වාසි 4 ට ලකුණු ½ x 4 = ලකුණු 02)*

(ආ) දුරකථන කවර කර්මාන්තය සඳහා පොදුවේ ඇති අවස්ථා **දෙකක්** හා තර්ජන **දෙකක්** ලියන්න.

අවස්ථා

1. ජංගම දුරකථන භාවිතය වර්ධනය වීම

2. නව මෝස්තර කෙරෙහි උනන්දු වීම

3. දූරකථනයේ ආරක්ෂාව කෙරෙහි ඇති දැඩි උනන්දුව

*(ලකුණු ½ x 2 = ලකුණු 01)*

තර්ජන

1. නව තරඟකරුවන් ඇතිවීම

2. දුරකථන මාදිලි නිතර නිතර වෙනස් වීම

3. දුරකථන කවර නිර්මාණය සඳහා යොදා ගන්නා යෙදවුම්වල මිල ඉහළ යාම

*( ලකුණු ½ x 2 = ලකුණු 01*

(v) අනුෂා සතුව ඇති ශක්තීන් **දෙකක්** සඳහන් කර, ඒවා ව්‍යාපාරයේ ඉදිරි සංවර්ධනයට කෙසේ යොදාගත හැකි දැයි පැහැදිලි කරන්න.

1. නිර්මානකරණ කුසලතාව

2. නිර්මානකරණය පිළිබඳ දැනුම

3. නිර්මානකරණය පිළිබඳ පළපුරුද්ද

4. නව තාක්ෂණ ක්‍රමවලට අනුගතවීමේ හැකියාව

5. උපාය මාර්ග හඳුනා ගැනීමේ හැකියාව

*(ශක්තීන් 2 ක් සඳහන් කිරීමට ලකුණු 01 x 2 = ලකුණු (*

*(ශක්තීන් දෙකක් පැහැදිලි කිරීමට 01 x 2 = ලකුණු (*

2. (i) කළමනාකරුවකු විසින් ප්‍රකාශ කරන ලද්දේ සමාගමේ අරමුණු හා සමාජය කෙරෙහි උනන්දුවන පාර්ශ්වයන්ගේ අරමුණු අතර ගැටුම්කාරී බව කළමනාකරුවන් හට අභියෝගයක් බවයි. සමාගමක අරමුණු සහ කොටස්කරුවන්ගේ අරමුණු උදාහරණ ලෙස ගනිමින් මෙම ප්‍රකාශය විස්තර කරන්න.

කොටස් කරුවන්ගේ අරමුණු වනුයේ තම ආයෝජන සඳහා උපරිම ලාභාංශයක් ලබා ගැනීම වුවද සමාගමක අරමුණ වන්නේ සමාගමේ ලාභ රඳවා ගනිමින් ප්‍රතිආයෝජන කිරීමයි.

*(ඉහත අදහස දැක්වෙන සම්පූර්ණ පිළිතුරකට ලකුණු 04යි. එසේ නොමැති නම් සුදුසු පරිදි ලකුණු ලබා දෙන්න.)*

(ii) (අ) 'තිරසර සංවර්ධනය' යන්න පැහැදිලි කරන්න.

තිරසර සංවර්ධනය යනු අනාගත පරම්පරාවේ අවශ්‍යතා සපුරා ගැනීමට ඇති අයිතිය උල්ලංඝනය නොකරමින් වර්තමාන අවශ්‍යතා ලඟාකර ගන්නා වූ සංවර්ධනයයි.

*(ඉහත අදහස ඇතුළත් පැහැදිලි කිරීමකට ලකුණු 02)*

(ආ) ව්‍යාපාරික සංවිධානයකට තම පාරිභෝගිකයින් කෙරෙහි ඇති සමාජ වගකීම් **දෙකක්** සඳහන් කරන්න.

1. සාධාරණ වීම
2. හානි අවම කිරීම
3. අයිතිවාසිකම් ආරක්ෂා කිරීම
4. ගුණාත්මක නිෂ්පාදිත ලබා දීම
5. පාරිභෝගික අපේක්ෂාවන් ඉටු කිරීම / පාරිභෝගිකයන්ට දුන් පොරොන්දු ඉටු කිරීම

*(ලකුණු 01 x 2 = ලකුණු 02)*

(iii) ව්‍යාපාර ආචාරධර්ම පිළිපැදීම තුළින් ව්‍යාපාර සංවිධානයකට ලබා ගත හැකි ප්‍රතිලාභ **හතරක්** සඳහන් කරන්න.

1. ගනුදෙනුකරුවන්ගේ විශ්වාසය වර්ධනය වීම / විකුණුම් වැඩිවී ලාභය ඉහළ යාම
2. ගනුදෙනුකරුවන් ආකර්ශනයට හා රඳවා ගැනීමට හැකිවීම .
3. තරඟකාරීත්වයට සාර්ථකව මුහුණ දීමට හැකිවීම
4. මනා මානව සම්පත් කළමනාකරණයක් පවත්වාගත හැකි වීම
5. ගිණුම්කරණ කටයුතු තුළ සිදුවන අක්‍රමිකතා හා විෂමාචාර පිටුදැකිය හැකි වීම
6. සේවක ආකර්ශනය පහසු වීම
7. ආයෝජකයන් පහසුවෙන් ආකර්ශනය කර ගත හැකිවීම

*(ලකුණු 01 x 4 = ලකුණු 04)*

(iv) (අ) ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය මගින් සුළු හා මධ්‍ය පරිමාණ ආයතන වෙත ලබා දෙන සේවා **හතරක් සඳහන් කරන්න.**

1. ප්‍රමිති පිරිවිතර ලබාගත හැකි වීම
2. පරීක්ෂණාගාර පහසුකම්
3. ජාතික හා ජාත්‍යන්තර ප්‍රමිති සහතික ලබා ගත හැකි වීම
4. ප්‍රමිතිකරණය හා තත්ත්ව පාලනය පිළිබඳ පුහුණු වීම්
5. පුස්තකාල සේවා
6. පද්ධති සහතිකකරණ සේවා
7. තොරතුරු සේවා

*(ලකුණු ½ x 4 = ලකු*

(ආ) ශ්‍රී ලංකා මහ බැංකුව මගින් මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා භාවිත කරනු ලබන ප්‍රතිපත්තිමය පොලී අනුපාත වර්ග **දෙකක්** විස්තර කරන්න.

1. නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය

   රජයේ සුරැකුම්පත් ඇපයට තබා (ප්‍රති මිලදී ගැනුම් ගනුදෙනුවලදී) අරමුදල් ල ගැනීමේ දී අයකරනු ලබන පොලී අනුපාතිකය

2. නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය -

   රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කිරීමේ දී (ප්‍රතිවිකුණුම් ගනුදෙනුවලදී) ගෙ ලබන පොලී අනුපාතිකය

3. බැංකු පොලී අනුපාතිකය -
   මහ බැංකුව වාණිජ බැංකුවලට ණය ලබා දීමේදී (අත්තිකාරම් ප්‍රදානය කිරීමේ අයකරන පොලී අනුපාතිකය

4. ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතා අනුපාතිකය

   වාණිජ බැංකු විසින් තම තැන්පතු සඳහා මහ බැංකුවේ තැන්පත් කළ යුතු සං අවශ්‍යතා

*(නම් කිරීමට කරුණු 2 ට ලකුණු ½ x 2 = ලකු*
*(විස්තර කිරීමට කරුණු 2 ට ලකුණු ½ x 2 = ලකු*

(v) පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අරමුණු **හතරක්** විස්තර කරන්න.

1. පාරිභෝගිකයින්ගේ ජීවිත හා දේපලවලට උපද්‍රවයක් සිදුවන භාණ්ඩ අලෙවිය හා සේ සැපයීමට එරෙහිව ඔවුන් ආරක්ෂා කිරීම
2. අසාධාරණ වෙළෙඳ පිළිවෙත්වලට විරුද්ධව පාරිභෝගිකයන් ආරක්ෂා කිරීම සහ පාරිභෝගිකයින්ගේ අයිතිවාසිකම් වලට නිසි සැලකිල්ල දැක්වීම සහතික වීම
3. හැකි සෑම විටම පාරිභෝගිකයන්ට තරඟකාරී මිලට භාණ්ඩ හා සේවාවලට ප්‍රමාණවත් ප්‍රවේශයක් ලබා දීම
4. පාරිභෝගික සුරැකුම්වලට සහනයක් ලබා දීම
5. පාරිභෝගිකයා අධ්‍යාපනය හා අවබෝධය තුලින් බල ගැන්වීම
6. ධාරිතා වර්ධනය මගින් සංවිධාන සංවර්ධනය

*(ලකුණු 1 x 4 = ලකු*

(i) බේකරි නිෂ්පාදනයට අවශ්‍ය යෙදවුම් මිල ඉහළ යාම නිසා බේකරි හිමියකු හවුල් ව්‍යාපාරයක් පිහිටුවා අතිරේක ප්‍රාග්ධනය සපයා ගැනීමට තීරණය කරන ලදී. මෙම තීරණයෙහි ඇති වාසි **හතරක්** විස්තර කරන්න.

1. වැඩි ප්‍රාග්ධනයක් රැස්කර ගත හැකි වීම
2. කීපදෙනකුගේ හැකියා හා දක්ෂතා ඒකරාශී කර ගත හැකිවීම
3. වගකීම කීපදෙනකු අතරේ බෙදී යාම
4. සාමූහික වගකීම නිසා ඇතිවන උනන්දුව හා කාර්යක්ෂමතාව වැඩි වීම
5. අලාභයක් ලැබුවහොත් එම අලාභය කිහිපදෙනකු අතර බෙදී යාම

*(කරුණු 4 ක් සඳහන් කිරීමට ½ x 4 = ලකුණු 02)*

*(කරුණු 4 ක් විස්තර කිරීමට ½ x 4 = ලකුණු 02)*

(ii) සිරිමලී විසින් තම ප්‍රදේශයෙන් බහුලව ලබාගත හැකි කෙසෙල් කෙඳි භාවිත කර කාන්තා අත් බෑග්, හිස්වැසුම් හා වෙනත් විසිතුරු නිර්මාණ නිපදවීමේ ආයතනයක් රු. 50 000ක මුදලක් ආයෝජනය කර ආරම්භ කරන ලදී. ඇය විසින් තම ප්‍රදේශයේ රැකියා විරහිත තරුණියන් තිදෙනකුට එම නිෂ්පාදන පිළිබඳ පුහුණුවක් ලබාදීමෙන් අනතුරුව දෛනිකව රු. 800 බැගින් ගෙවීමේ පදනම මත සේවයට බඳවා ගන්නා ලදී. එසේ ම තම නිෂ්පාදන සංචාරක හෝටල් තුළ අලෙවි කිරීමට ද කටයුතු සිදු කරන ලදී. මෙම සිද්ධිය තුළ ඇති සමාජීය හා ආර්ථික ප්‍රතිලාභ මොනවා දැයි දක්වන්න.

1. දේශීය සම්පත් භාවිතය
2. ආදායම් ව්‍යාප්ති විෂමතා අවම වීම
3. නව රැකියා අවස්ථා උත්පාදනය
4. නව ආදායම් අවස්ථා බිහිවීම
5. ජනතාවගේ ජීවන මට්ටම ඉහළ යාම
6. නව වෙළඳපොල සංවර්ධනය / ව්‍යාපාර වර්ධනය හා සංවර්ධනය
7. නව භාණ්ඩ පරිභෝජනයට අවස්ථාව ලැබීම

8 - පරිසර හිතකාමී නිෂ්පාදන බිහිවීම

9 - විදේශ විනිමය උපයා ගැනීමට හැකිවීම

*(ලකුණු 01 x 4 = ලකුණු 04)*

(iii) විශාල ආයතනයක් වීමෙන් ලැබෙන ප්‍රතිලාභ නොසලකා හරිමින් ඇතැම් ආයතන කුඩා ව්‍යාපාර ලෙසටම පවත්වා ගැනීමට අදහස් කරන්නේ ඇයි දැයි දැක්වීමට හේතු **හතරක්** විස්තර කරන්න.

1. සේවක ගැටළු අවම වීම :- මානව සම්පත ලබා ගැනීම සඳහා වැඩි පිරිවැයක් දැරිය යුතු නොවීම
2. පොදු කාර්ය පිරිවැය අවම වීම :- ගොඩනැගිලි කුලී, ජලය, විදුලිය ආදී පිරිවැය අවම වීම
3. නම්‍යශීලීතාවය පැවතීම :- වෙනස්වීම් සඳහා ක්ෂණිකව ප්‍රතිචාර දැක්වීමට හැකිවීම
4. ආයතනයේ මෙහෙයුම් කටයුතුවල ගුණත්වය රැකගත හැකිවීම :- කුඩා පරිමාණයෙන් පවත්වාගෙන යාමේ දී ගුණත්වය පිළිබඳ ඉහළ අවධානයක් යොමු කළ හැකි වීම
5. ඉහළ ලාභ කොටසක් හිමිවීම :- පිරිවැය අවම වීම නිසා ඉහළ ලාභයක් ලැබිය හැකි වීම.
6. ගනුදෙනුකරුවන් සමග ඍජු සම්බන්ධතා පවත්වාගත හැකි වීම

7) නව පාලන බලය ඇත්නම් අයිතිය තුන් හැකිවීමට ඇති ඉඩකඩ

*(හේතු 4 ක් සඳහන් කිරීමට ½ x 4 = ලකුණු 02)*

*(විස්තර කිරීමට ½ x 4 = ලකුණු 02)*

(iv) (අ) 'ක්ෂණික ප්‍රතිචාර කේත' (Quick Response Code) භාවිතය මගින් ව්‍යාපාරිකයකුට ලබා ගත හැකි වාසි **දෙකක්** දක්වන්න.

1. පාරිභෝගික විශ්වාසය ඉහළ යාම
2. ආයතනයේ විකුණුම් ප්‍රමාණය වැඩි වී ලාභය ඉහළ යාම
3. භාණ්ඩ පිළිබඳ තොරතුරු ඉක්මණින් ලබා ගත හැකි වීම
4. පාරිභෝගිකයාට අන්තර්ජාලය හරහා මෙම කේතය මගින් සියලු විස්තර ලබා ගත හැකි හෙයින් භාණ්ඩය පිළිබඳ ප්‍රවර්ධන වියදම අවම වීම
5. වෙළෙඳ ප්‍රචාරණ ක්‍රමයක් ලෙස යොදා ගත හැකි වීම
6. ගනුදෙනු වේගවත් වීම

*(ලකුණු 01 x 2 = ලකුණු 02,*

(ආ) විද්‍යුත් මුදල් පසුම්බිය (e-wallet) භාවිත කර ජංගම දුරකථනයකින් ගනුදෙනු සඳහා මුදල් ගෙවීමේ දී පුද්ගලයකු විසින් සපුරා තිබිය යුතු මූලික කරුණු **දෙකක්** දක්වන්න.

1. විද්‍යුත් මුදල් පසුම්බි යෙදවුම (E-wallet application) බාගත (download) කර ගැනීම
2. පෞද්ගලික තොරතුරු (නම, විද්‍යුත් තැපැල් ලිපිනය, ජංගම දුරකථන අංකය ආදී) ඇතුළත් කිරීම
3. පෞද්ගලික හැඳුනුම් අංකය (Personal Identification Number (PIN)) සකස් කර ගැනීම
4. හරපත හෝ ණයපත විද්‍යුත් මුදල් පසුම්බිය සමග සම්බන්ධ කර ගැනීම

*(ලකුණු 01 x 2 = ලකුණු 0*

(v) (අ) රාජ්‍ය දෙපාර්තමේන්තුවක ලක්ෂණ **හතරක්** සඳහන් කරන්න.

1. ආමාත්‍යාංශයක් යටතේ ඍජු පාලනයට යටත් වීම
2. ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසිවලට අනුව කටයුතු කිරීම
3. බොහෝවිට සේවා සැපයීමේ නිරතවීම
4. රජයේ ඒකාබද්ධ අරමුදලින් ප්‍රතිපාදන ලැබීම/ රජයේ වාර්ෂික අය-වැය ලේඛනය මගින් අවශ්‍ය අරමුදල් ප්‍රතිපාදනය කිරීම
5. නීතිය ඉදිරියේ දෙපාර්තමේන්තුවක් නෛතික පුද්ගලයකු ලෙස පිළිනොගැනීම

*(ලකුණු ½ x 4 = ලකුණු 0*

(ආ) රාජ්‍ය සංස්ථාවක් රාජ්‍ය දෙපාර්තමේන්තුවකින් වෙන් කර හඳුනා ගත හැකි ලක්ෂණ **දෙකක්** පැහැදිලි කරන්න.

1. විශේෂ හෝ පොදු පනතක් යටතේ සංස්ථාපනය වීම
2. නෛතික පුද්ගල භාවයක් තිබීම
3. රජය විසින් පත්කරන අධ්‍යක්ෂ මණ්ඩලයක් මගින් කළමනාකරණය වීම
4. රාජ්‍ය ණය, ලාභාංශ ප්‍රතිආයෝජන හා මහජනතාව ණය ප්‍රාග්ධනයට දායකකර ගැනීම ආදියෙන් ප්‍රාග්ධනය සම්පාදනය කර ගැනීම
5. ප්‍රාග්ධනයට රජය මෙන්ම පෞද්ගලික අංශය ද සහභාගි කරගත හැකිවීම

*(ලක්ෂණ 2 ක් පැහැදිලි කිරීමට 01 x 2 = ලකුණු*

**4.** (i) විධිමත් හා අවිධිමත් මූල්‍ය සම්පාදන මාර්ගවලින් මුදල් ලබාගෙන තම ප්‍රදේශයේ කිරි නිෂ්පාදන මිලට ගෙන විකිණීමේ ආයතනයක් ආරම්භ කිරීමට ලක්ෂ්මී අදහස් කර සිටියි. අවිධිමත් මූල්‍ය සම්පාදන මාර්ගවලට වඩා විධිමත් මූල්‍ය සම්පාදන මාර්ග තුළින් ලක්ෂ්මීට ලබා ගත හැකි වාසි **හතරක්** විස්තර කරන්න.

1. අයකරන පොළී අනුපාතය නිශ්චිත වීම
2. ඇප-සුරැකුම් සඳහා ආරක්ෂාව හිමිවීම
3. කොන්දේසි විධිමත් හා නිශ්චිත වීම
4. ආපසු ගෙවීම සඳහා දිගු කාලයක් ලබා ගත හැකි වීම
5. ව්‍යාපාරය ක්‍රමානුකූලව පවත්වාගෙන යාමට පෙළඹීම
6. ණය මුදල් ආයෝජනය කිරීම පිළිබඳව ණය දෙනු ලබන ආයතනය මඟින් අධීක්ෂණයක් සිදු කිරීම
7. අසාර්ථක වීමේ ඉඩකඩ අවම වීම
8. සාපේක්ෂව පොළී ප්‍රතිශතය අඩුවීම

*වාසි දැක්වීමට ½ x 4 = ලකුණු 02*

*විස්තර කිරීමට ½ x 4 = ලකුණු 02*

(ii) (අ) 'ධාරක චෙක්පත්', 'විධාන චෙක්පත්' හා සසඳන්න.

| ධාරක චෙක්පත | විධාන චෙක්පත |
|---|---|
| රැගෙන එන්නාට ගෙවීම් කරයි | විධානයට පමණක් මුදල් ගෙවයි |
| පැවරීමේ දී පිටසන් කිරීම අවශ්‍ය නොවේ | පැවරීමේ දී පිටසන් කිරීම අනිවාර්ය වේ |
| ආරක්ෂාව අඩුය | ආරක්ෂාව වැඩිය |

*කරුණු 2 ක් සැසඳීමට 01 x 2 = ලකුණු 02*

(ආ) 'සේව්‍ය වගකීම් රක්ෂණය' යන්න විස්තර කරන්න.

සේවයේ යෙදී සිටිය දී සේවකයින්ට සිදුවන අනතුරු වෙනුවෙන් වන්දි ගෙවීම සේව්‍යයාගේ වගකීමයි. එවැනි අවස්ථාවක දී වන්දි ගෙවීමේ වගකීම රක්ෂණ ආයතනයකට පැවරිය හැකිය. එය සේව්‍ය වගකීම් රක්ෂණය වේ.

*(මෙම අදහස ඇතුළත් සම්පූර්ණ පිළිතුරට ලකුණු 02)*

(iii) ශ්‍රී ලංකාවේ දුම්රිය ප්‍රවාහන සේවයේ ඇති දුර්වලතා **හතරක්** සඳහන් කර, එම දුර්වලතා මගහරවා ගැනීමට විසඳුම් යෝජනා කරන්න.

| | දුර්වලතා | යෝජනාව |
|---|---|---|
| 1 | දුම්රිය මාර්ග දිවයින පුරා ව්‍යාප්ත නොවීම | නව දුම්රිය මාර්ග ඇති කිරීම හා ව්‍යාප්ත කිරීම |
| 2 | ගමනාන්තය දක්වා යොදා ගත නොහැකි නිසා වෙනත් ප්‍රවාහන ක්‍රම යොදා ගැනීමට සිදු වීම | ගමනාන්තය දක්වා යොදාගත හැකිවන සේ අනෙකුත් ප්‍රවාහන මාධ්‍යයන් සමඟ සම්බන්ධ කිරීම |
| 3 | අවශ්‍ය ඕනෑම වේලාවක දී සේවය ලබා ගත නොහැකි වීම | දුම්රිය ධාවනය වන වාර ගණන වැඩි කිරීම |
| 4 | විදුලි සංඥා ඇන හිටීම, දුම්රිය මාර්ග අබලන් වීම, ආදිය නිසා ප්‍රමාද ඇති වීම | සංඥා පද්ධති වැඩි දියුණු කිරීම, නව තාක්ෂණික ක්‍රම යොදා ගැනීම, දුම්රිය මාර්ග හොඳින් නඩත්තු කිරීම |
| 5 | භාණ්ඩ ප්‍රවාහනයේ දී ඒවාට හානි සිදු වීම | භාණ්ඩ පැටවීම හා බෑම සඳහා නවීන තාක්ෂණික උපකරණ යොදා ගැනීම |
| 6 | භාණ්ඩ හා මගීන් ප්‍රවාහනයට අවශ්‍ය පහසුකම් අඩුවීම | දුම්රිය මැදිරි නවීකරණය කිරීම හා විවිධ භාණ්ඩවලට ගැළපෙන පරිදි දුම්රිය මැදිරි යොදා ගැනීම |

*(ගැටළු 4 ක් නම් කිරීමට ½ x 4 = ලකුණු 02*

*(යෝජනා 4 ක් නම් කිරීමට ½ x 4 = ලකුණු 02*

(iv) (අ) ව්‍යාපාර කටයුතු සඳහා සන්නිවේදනය වැදගත් වන ආකාර **හතරක්** සඳහන් කරන්න.

1. වෙළඳ ගණුදෙනුවලදී අදාළ පාර්ශවයන් අතර අදහස් හුවමාරු කර ගැනීම සඳහා
2. සේව්‍ය-සේවක හා සේවක-සේවක සම්බන්ධතා පවත්වා ගැනීම සඳහා
3. අලෙවි ප්‍රවර්ධන කටයුතු සඳහා
4. මානව හා භෞතික සම්පත් මනාව කළමනාකරණය සඳහා
5. ප්‍රාග්ධනය සම්පාදනය කර ගැනීම සඳහා
6. පර්යේෂණ හා සංවර්ධන කටයුතු සඳහා

*(කරුණු 4 ක් නම් කිරීමට ½ x 4 = ලකුණු 02*

(ආ) වාචිකව පණිවුඩයක් සන්නිවේදනය කිරීමේ දී එම පණිවුඩය වෙනස් වීම කෙරෙහි බලපාන හේතු **හතරක්** දක්වන්න.

1. භාෂාව තේරුම් නොගැනීම
2. අදහස් නිවැරදිව ප්‍රකාශ නොකිරීම
3. පණිවිඩය නිවැරදිව තේරුම් නොගැනීම
4. පණිවිඩය ලබන්නා, ඒ පිළිබඳ අවධානය යොමු නොකිරීම
5. ශ්‍රවණයේ දී බාධා සිදුවීම
6. අදහස් ප්‍රකාශ කිරීමේ දී එය වේගවත්ව සිදු කිරීම
7. විශාල තොරතුරු ප්‍රමාණයක් එකවර ප්‍රකාශ කිරීම
8. ප්‍රමාණවත් ලෙස තොරතුරු ඉදිරිපත් නොකිරීම

*(කරුණු 4 ක් නම් කිරීමට ½ x 4 = ලකුණු 0*

(v) (අ) 'සාපේක්ෂ පිරිවැය වාසිය' යන්න විස්තර කරන්න.

රටක් භාණ්ඩ ආනයනය කිරීමට සාපේක්ෂව අඩු පිරිවැයකින් නිපදවිය හැකි නම් එම භාණ්ඩ නිපදවා අපනයනය කළ යුතු බවත්, භාණ්ඩ නිපදවීමට සාපේක්ෂව අඩු පිරිවැයකින් ආනයනය කළ හැකි නම් එම භාණ්ඩ ආනයනය කළ යුතු බවත් මින් අදහස් වේ.

(අඩු ආවස්ථික පිරිවැය)

*(මෙම අදහස සහිත සම්පූර්ණ පිළිතුරට ලකුණු 02)*


(ආ) 'විද්‍යුත් ගෙවීම් ක්‍රම' යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද?

භෞතික මුදල් භාවිතයෙන් තොරව අන්තර් ජාල සම්බන්ධතා උපයෝගී කරගෙන මුදල් ගනුදෙනු පියවීමේ ක්‍රමයකි

*(ඉරි ඇඳි පදය සහිතව පැහැදිලි කිරීමට ලකුණු 02 යි)*

## II කොටස

**5. (i) පහත දැක්වෙන්නේ සංවිධාන සටහනක කොටසකි.**




(අ) 'සංවිධාන ව්‍යුහය' යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද?

ආයතනයේ අරමුණු ඉටුකර ගැනීම සඳහා ආයතනයේ තනතුරු කාර්යය, බලතල, වගකීම්, වගවීම් ආදිය බෙදී ගොස් ඇති ආකාරය සහ සමායෝජනය වී ඇති ආකාරය සංවිධාන ව්‍යුහය වේ.

*(සම්පූර්ණ පැහැදිලි කිරීමට ලකුණු 02)*

(ආ) 'පාලන අවකාශය' යන්න පැහැදිලි කරමින් ඉහත දී ඇති සංවිධාන සටහන අනුව අලෙවි කළමනාකරුගේ පාලන අවකාශයේ තරම දක්වන්න.

එක් කළමනාකරුවෙකුට සෘජුව වාර්තා කරනු ලබන සහායකයින් සංඛ්‍යාව පාලන අවකාශය වේ.

*(ලකුණු 01)*

∴ පුළුල් පාලන අවකාශයකි.

*(ලකුණු 01)*

(ii) (අ) 'සහගාමී පාලනය' සහ 'පසු පෝෂණ පාලනය' යනුවෙන් අදහස් කරන්නේ කුමක් දැයි පැහැදිලි කරන්න.

**සහගාමී පාලනය**

ආයතනයක වැඩ කටයුතු සිදුවන අතරතුර විචලනයන් වළක්වා ගැනීමට ක්‍රියාමාර්ග ගැනීමයි.

*(ලකුණු 01)*

**පසු පෝෂණ පාලනය**

ආයතනයක අපේක්ෂිත කාර්ය හා සත්‍ය කාර්ය ඵල අතර ඇති විචලන නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීමයි

*(ලකුණු 01)*

(ආ) ව්‍යාපාර සංවිධානයකට පර්යේෂණය හා සංවර්ධනය වැදගත් වීමට හේතු හතරක් සඳහන් කරන්න.

1. නිෂ්පාදිතයේ ගුණත්වය ඉහළ නැංවීම
2. නිෂ්පාදන ක්‍රියාවලියේ කාර්යක්ෂමතාව වැඩිවීම
3. නිෂ්පාදන පිරිවැය අඩුකරගත හැකි වීම

4. නව භාණ්ඩ හා සේවා හඳුන්වා දිය හැකි වීම

5. අපතේ යාම් අවම කිරීමට හෝ ශූන්‍ය කිරීමට හැකිවීම

6. පාරිභෝගික තෘප්තිය ඉහළ නැංවිය හැකි වීම

7. නව තාක්ෂණික ක්‍රම භාවිත කළ හැකි වීම

*(කරුණු 4 ට ලකුණු ½ x 4 = ලකුණු 02)*

(iii) පහත දැක්වෙන්නේ X Y සමාගමේ තොරතුරු කිහිපයකි.

| | අයවැයගත (රු.) | සත්‍ය (රු.) |
|---|---|---|
| විකුණුම් ආදායම | 3 000 | 2 750 |
| විකුණුම් පිරිවැය | 2 100 | 12 700 |

(අ) විකුණුම් ආදායම් විචලනය හා විකුණුම් පිරිවැය විචලනය ගණනය කරන්න.

විකුණුම් ආදායම් විචලනය රු. 3000 - රු. 2750 = රු. 250/-

විකුණුම් පිරිවැය විචලනය රු. 2100 - රු. 12700 = රු. -10600/- හෝ (රු.10,600/-)

*(ලකුණු 01 x 2 = ලකුණු 02)*

*(පිළිතුර පමණක් ප්‍රමාණවත්)*

(ආ) විකුණුම් ආදායම් විචලනය විය හැකි **හේතු දෙකක්** පැහැදිලි කරන්න.

i. විකුණුම් ප්‍රමාණය අඩු හෝ වැඩි වීම

ii. විකුණුම් මිල අඩු හෝ වැඩි වීම

*(ලකුණු 01 x 2 = ලකුණු 02)*

(iv) "මෝටර් රථ නිෂ්පාදනයේ දී වැඩි වශයෙන් යොදාගනුයේ ප්‍රවාහ නිෂ්පාදන ක්‍රමයයි." මෙම ක්‍රමය මෝටර් රථ නිෂ්පාදනය සඳහා භාවිත කිරීමෙන් ලැබෙන වාසි **හතරක්** සඳහන් කර, ඒවා පැහැදිලි කරන්න.

1. නිපදවන ඒකක සංඛ්‍යාව වැඩි නිසා ඒකක පිරිවැය අඩුවීම මගින් ආර්ථික පිරිමැසුම් ලබාගත හැකිවීම.

2. අවම සේවක සංඛ්‍යාවක් මගින් වුවද නිෂ්පාදන ප්‍රවාහය පාලනය කළ හැකි වීම නිසා සේවක සංඛ්‍යාව අඩුකරගත හැකි වීම.

3. සමස්ථ වෙළෙඳපොල පිළිබඳ අවධානය යොමුකළ හැකි බැවින් වෙළෙඳපොල ව්‍යාප්ත කරගත හැකි වීම.

4. නවීන තාක්ෂණය පහසුවෙන් යොදාගත හැකිවීමෙන් නිෂ්පාදනයේ කාර්යක්ෂමතා වැඩිකරගත හැකි වීම.

5. මහා පරිමාණ නිෂ්පාදනය නිසා වෙළෙඳපොළ ඒකාධිකාරයක් නිර්මාණය කිරීම පහ වීම.

6. තරඟකාරීත්වයට පහසුවෙන් මුහුණදිය හැකි වීම.


(කරුණකට ලකුණු 1 x 4 = ලකුණු 0

(v) 'ක්‍රියාවලි පිරියත', 'නිෂ්පාදන පිරියත' හා සසඳන්න.

| ක්‍රියාවලි පිරියත | නිෂ්පාදිත පිරියත |
|---|---|
| 1. නිශ්පාදන ක්‍රියාවලියේ එක් අදියරක් සම්පූර්ණ කිරීමට අවශ්‍ය සියළු දේ එක් ස්ථානයක සිදු වේ. | 1. සමස්ථ නිෂ්පාදන ක්‍රියාවලිය එක් කාර්ය ස්ථානයකින් ඊළඟ කාර්ය ස්ථානයට රේඛීය අනු පිළිවෙළට ගලායයි. |
| 2. නිෂ්පාදනය අංශ අතර ඉදිරියට හා පසු පසට මාරුවීමක් සිදු වේ. | 2. නිෂ්පාදනය අංශ අතර රේඛීයව මාරු වේ. |
| 3. ප්‍රාග්ධන ආයෝජනය සාපේක්ෂව අඩුය. | 3. ප්‍රාග්ධන ආයෝජනය සාපේක්ෂව වැඩිය. |
| 4. එකම යන්ත්‍රය විවිධ ආකාරයෙන් නිෂ්පාදනයට යොදා ගනී. | 4. භාණ්ඩ නිෂ්පාදනයේදී යන්ත්‍රය විවිධ ආකාරයෙන් සකසා ගැනීමක් සිදු නොකරේ. |
| 5. නිෂ්පාදනය සඳහා ගතවන කාලය සාපේක්ෂව වැඩිය. | 5. නිෂ්පාදනය සඳහා ගතවන කාලය සාපේක්ෂව අඩුය. |
| 6. තොග පවත්වාගෙන යාම සාපේක්ෂව වැඩිය. | 6. තොග පවත්වාගෙන යාම සාපේක්ෂව අවම ෙ |
| 7. සිදු කෙරෙන වැඩ ප්‍රමාණය වැඩිය. | 7. සිදු කෙරෙන වැඩ පමාණය අවමය. |

( 01 x 4 = ලකුණු (

**6.** (i) XYZ සමාගමේ රූපවාහිනී යන්ත්‍රවල තොග මට්ටම් පිළිබඳව ප්‍රස්තාර සටහනක් පහත දැක්වේ.




පහත දෑ ගණනය කරන්න.

(අ) චක්‍රීය කාලය
(ආ) යළි ඇණවුම් ප්‍රමාණය
(ඉ) ආරක්ෂිත තොගය
(ඊ) පොරොත්තු කාලය

අ. චක්‍රීය කාලය - සති 04 (ලකුණු 01)

ආ. යලි ඇණවුම් ප්‍රමාණය - ඒකක 4000 (ලකුණු 01)

ඉ. ආරක්ෂිත තොගය - ඒකක 2000 (ලකුණු 01)

ඊ. පොරොත්තු කාලය - සති 02 (ලකුණු 01)

(ii) **ද්‍රව්‍ය ඵලදායීතාවය වර්ධනය කළ හැකි ආකාර හතරක් සඳහන් කරන්න.**

- ඉහළ තත්වයෙන් යුත් අමුද්‍රව්‍ය යොදා ගැනීම
- අපතය හා නාස්තිය අවම කර ගැනීම
- ප්‍රශස්ත ආකාරයෙන් ද්‍රව්‍ය තොග පවත්වාගෙන යෑම
- ද්‍රව්‍ය නැවත නැවත භාවිතයට ගැනීම හා ප්‍රතිචක්‍රීයකරණය
- දියුණු තාක්ෂණය යොදා ගැනීම තුලින්

***(කරුණකට ලකුණු 1 x 4 = ලකුණු 04)***

(iii) (අ) **'වෙළෙඳපොළ ඛණ්ඩනය' යනු කුමක් ද?**

විවිධ ගති ලක්ෂණවලින් යුක්ත සමස්ථ වෙළඳපොළ සමජාතිය ගති ලක්ෂණවලින් යුක්ත වූ කණ්ඩායම්වලට බෙදා වෙන් කිරීම වෙළඳපොළ ඛණ්ඩනයයි.

***(ලකුණු 02)***

(ආ) **වෙළෙඳපොළ ඛණ්ඩනය විකුණුම් වර්ධනයට උදව් වන ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න.**

වෙළඳ පොළ ඛණ්ඩනය තුළින් අවශ්‍යතා හා වුවමනා සපුරාලිය යුතු විශේෂිත පාරිභෝගික කණ්ඩායම් හඳුනාගෙන ඔවුන් වෙත ළඟාවීමේ පහසුව ලබා ගත හැකිය. මේ නිසා ව්‍යාපාරවලට තම සම්පත් වඩාත් ඵලදායීව සහ ප්‍රශස්ථ උපාය මාර්ග මගින් අලෙවිකරණ තීරණ ගත හැකිවේ. සමස්ථ පාරිභෝගිකයින් අතරින් මෙම පාරිභෝගික ප්‍රතිශතය කුඩා වුවද ඔවුන්ට වඩාත් එම භාණ්ඩය හෝ සේවාව වුවමනා වන හෙයින් විකුණුම් වර්ධනය වේ.

***(සම්පූර්ණ පිළිතුරකට ලකුණු 02)***

(iv) **'පාරිභෝගික වටිනාකම' හා 'පාරිභෝගික තෘප්තිය' අතර ඇති සම්බන්ධතාවය විස්තර කරන්න.**

පාරිභෝගික අවශ්‍යතා ඉටු කිරීමට නිෂ්පාදිතයකට ඇති හැකියාව පිළිබඳ පාරිභෝගිකයා විසින් කරුණු ලබන සමස්ත ඇගයීම පාරිභෝගික වටිනාකම වේ. මෙම සමස්ත ඇගයීම සඳහා නිෂ්පාදිතයක ගුණත්වය, සේවා හා මිල ආදිය සැලකිල්ලට ගනී.

***(ලකුණු 01 යි)***

පාරිභෝගිකයා අපේක්ෂා කරන ආකාරයට නිෂ්පාදිතයක් බිහි කිරීම මඟින් පාරිභෝගිකයා අත්පත් කරනු ලබන සතුට පාරිභෝගික තෘප්තිය වේ.

(ලකුණු 01 යි)

පාරිභෝගිකයා අපේක්ෂා කරන වටිනාකම නිෂ්පාදිතයකින් නොලැබේ නම් පාරිභෝගිකයා අතෘප්තිමත් වන අතර අපේක්ෂා කරන වටිනාකම ඒ අයුරින්ම පාරිභෝගිකයාට හිමිවේ නම් ඔහු තෘප්තිමත් වේ. එසේම අපේක්ෂා කළ වටිනාකමට වඩා ඉහළ වටිනාකමක් නිෂ්පාදිතයෙන් ලබා දේ නම් උපරිම ලෙස තෘප්තියට පත් වේ.

(ලකුණු 02)

(v) (අ) 'භාණ්ඩයක ජීවන චක්‍රය' (PLC) යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද?

භාණ්ඩයක සංවර්ධන අවස්ථාවේ සිට විකුණුම් පිරිහීමේ අදියර දක්වා පවතින අදියරයන් භාණ්ඩයක ජීවන චක්‍රය වේ.

(ලකුණු 02

(ආ) නිෂ්පාදකයකුට භාණ්ඩයක ජීවන චක්‍රය අවබෝධ කර ගැනීම තුළින් ලැබිය හැකි වාසි **දෙකක්** ලියන්න.

1. භාණ්ඩයක ජීවන චක්‍රයේ එක් එක් අදියරයේ දී නිෂ්පාදකයාට තිබෙන අභියෝග වටහා ගත හැකිවීම තුළින් එම අභියෝග සඳහා කල්තියා සූදානම් විය හැකි වීම.
2. ඒ ඒ අදියරේ දී ගතයුතු තීරණ ඉතා ඉක්මණින් හා පහසුවෙන් ගත හැකි වීම
3. තරඟකාරී වාසි ලබා ගැනීම සඳහා ක්‍රියා කළ හැකිවීම
4. නිෂ්පාදිතයේ එක් එක් අදියරයේ දී ගතයුතු අලෙවිකරණ උපක්‍රම හා ක්‍රමෝපායන් හඳුනාගත හැකිවීම

විකුණුම් පුරෝකථනය කළ හැකි වීම.

(ලකුණු 1 x 2 = ලකුණු 02

7. (i) ව්‍යාපාර සංවිධානයක බාහිර මූල්‍ය සම්පාදන මාර්ග **දෙකක්** හා ඒවායේ සීමා **දෙකක්** පැහැදිලි කරන්න.

බාහිර මූල්‍ය සම්පාදන මාර්ග

1. කොටස් නිකුතුව
2. බැංකු ණය
3. කල්බදු
4. උකස්කර
5. කුලීපිට ගැනුම්
6. ණයකර
7. බැංකුඅයිරා

(කරුණු 1 x 2 = ලකුණු 02

බාහිර මූල්‍ය සම්පාදන මාර්ගවල සීමා

1. සපයා ගැනීමේ පිරිවැය වැඩිවීම
2. අරමුදල් සපයා ගැනීම පහසු නොවීම
3. ඇප සුරකුම් අවශ්‍ය වීම
4. ව්‍යාපාරයේ වගකීම් වැඩිවීම

*(සීමා 2 ට ලකුණු 1 x 2 = ලකුණු 02)*

(ii) (අ) ව්‍යාපාරික තීරණ කෙරෙහි ද්‍රවශීලතා අනුපාතවල වැදගත්කම විස්තර කරන්න.

i. කෙටි කාලීන වගකීම්වලට මුහුණ දීමට ඇති හැකියාව දැනගත හැකි වීම
ii. ජංගම වගකීම් ක්ෂණිකව පියවීමේ හැකියාව දැනගත හැකි වීම
iii. [illegible]

*(ලකුණු 1 x 2 = ලකුණු 02)*

(ආ) සමාගමක කොටස් මිල වැඩි වීම කෙරෙහි බලපාන සාධක හතරක් සඳහන් කරන්න.

i. කොටස් සඳහා ඇති ඉල්ලුම හා සැපයුම
ii. සමාගමේ කීර්තිනාමය
iii. සමාගමේ ලාභාංශ ප්‍රතිපත්ති
iv. රටේ ආර්ථික සාධක
v. දේශපාලන සාධක
vi. ආයෝජකයින්ගේ හැසිරීම
vii. කළමනාකරුවන්ගේ හැකියාව

*(ලකුණු ½ x 4 ට = ලකුණු 02)*

(iii) (අ) දත්ත, තොරතුරු හා සංසන්දනය කරන්න.

| දත්ත | තොරතුරු |
|---|---|
| • දත්ත සැකසුම් ක්‍රියාවලියට ආදානය කරන මූලික දෑ දත්ත වේ. | • දත්ත සැකසීමේ ක්‍රියාවලියෙන් බිහිවන ප්‍රතිදානය තොරතුරු වේ. |
| • තීරණ ගැනීමට සෘජුවම භාවිත කළ නොහැකිය. | • තීරණ ගැනීමට භාවිත කළ හැකිය. |
| • දත්ත, දත්ත වශයෙන් පවතින තෙක් වටිනාකමක් නොමැත. | • තොරතුරුවල වටිනාකමක් ඇත. |
| • අමුද්‍රව්‍යයකි / යෙදවුමකි. | • නිමි ද්‍රව්‍යයකි. |

*(ලකුණු 1 x 2 = ලකුණු 02)*

(ආ) 'දැනුම් සේවකයින්' යන්න පැහැදිලි කර, එවැනි සේවකයින් සඳහා උදාහරණ **දෙකක්** සපයන්න.

දැනුම් සේවකයන් යනු ඉහළ අධ්‍යාපන සුදුසුකම් ඇති වෘත්තිකයින් වන අතර ඔවුන් තොරතුර ජනිත කරන පුද්ගලයන්ය.

(ලකුණු

උදා

- නීතිඥයින්
- ගණකාධිකාරීන්
- විගණකවරුන්
- ඉංජිනේරුවරුන්
- වෙනත් සුදුකරපටි වෘත්තිකයින් (White coller jobs)

(ලකුණු ½ x 2 = ලකුණු

(iv) (අ) 'රැකියා විස්තරය' හා 'රැකියා පිරිවිතරය' අතර වෙනස්කම් **දෙකක්** දක්වන්න.

| රැකියා විස්තරය | රැකියා පිරිවිතරය |
|---|---|
| • රැකියාව විස්තර කරයි. | • රැකියාවේ නියුක්ත වීමට යෝග්‍ය පුද්ගලයා විස්තර කරයි. |
| • රැකියාවට අයත් කටයුතු, රාජකාරි හා වගකීම් විස්තර කරයි. | • කිසියම් රැකියාවක් කාර්යක්ෂමව හා සඵලදායීව ඉටු කිරීමට පුද්ගලයාට තිබිය යුතු මූලික සුදුසුකම් විස්තර කරයි. |
| • රැකියාවේ ගති ලක්ෂණ පිළිබඳ ලේඛනයකි. | • රැකියා සාර්ථකව ඉටුකිරීමට තිබිය යුතු මානව ගති ලක්ෂණ ලේඛනයකි. |
| • රැකියා විස්තරයේ කොටසක් ලෙස රැකියා පිරිවිතරය අඩංගු වේ. | • රැකියා පිරිවිතරයේ කොටසක් ලෙස රැකියා විස්තරය අඩංගු නොවේ. |

(වෙනස්කම් 2 ට ලකුණු 1 x 2 = ලකුණු 0

(ආ) සේවකයින් වෘත්තීය සමිතිවල සාමාජිකත්වය ලබා ගැනීමට හේතු **දෙකක්** ලියන්න.

i. සාධාරන වැටුපක් ලබා ගැනීම හා වර්ධකය
ii. යහපත් වැඩ පරිසරයක් ලබා ගැනීම
iii. වැඩ කරන කාලය පිළිබඳ ගැටළු විසඳා ගැනීම
iv. වෘත්තිය සෞඛ්‍ය හා වෘත්තිය අනතුරුවලින් ආරක්ෂාව සලසා ගැනීම
v. රැකියා සුරක්ෂිතතාව ඇති කර ගැනීම
vi. අධ්‍යාපනය හා පුහුණුව ලබා ගැනීම
vii. සාමූහික කේවල් කිරීම

(හේතු 2 ට ලකුණු 1 x 2 = ලකුණු 0

(v) ආයතනයකට අලෙවි සහකරුවන් බඳවා ගැනීම සඳහා පුවත්පත් දැන්වීමක් පළ කිරීමට තීරණය කරන ලදී. මෙසේ පුවත්පත් දැන්වීමක් මගින් අයදුම්කරුවන් ආකර්ශනය කර ගැනීමේ ඇති වාසි **දෙකක්** හා අවාසි **දෙකක්** කෙටියෙන් විස්තර කරන්න.

වාසි

- වැඩි පිරිසක් අයදුම්කරන නිසා සුදුසුම අයදුම්කරු තෝරාගත හැකිය.
- අඩු පිරිවැයකින් වැඩි පිරිසක් ආකර්ශනය කරගත හැකිය.
- වෙනත් ක්‍රමවලට සාපේක්ෂව පහසු ක්‍රමයක් වීම.
- අයදුම්පත් ආකෘති, සීමාව, අවසාන දිනයන් ආදී විස්තර පුවත්පත් තුලම ඇතුළත් කළහැකි වීම.
- ව්‍යාපාර හැකියාව අනුව දැන්වීමේ නම්‍යශීලීතාවය ඇතිකරගත හැකි වීම.

*(ලකුණු 1* **x 2** = *ලකුණු 02)*

අවාසි

- අයදුම්පත් ලැබීමට වැඩිකාලයක් ගතවීම.
- අනවශ්‍ය අයදුම්පත් ලැබීමට ඇති හැකියාව.
- වඩාත් සුදුසු අයදුම්කරුවන් මග හැරීමට ඇති හැකියාව.
- විශාල අයදුම්පත් සංඛ්‍යාවක් ලැබීම නිසා ඒවා අතුරෙන් සුදුසු අයදුම්පත් තෝරාගැනීමට වැඩිකාලයක් හා පිරිවැයක් දැරීමට සිදුවීම.

*(ලකුණු 1* **x 2** = *ලකුණු 02)*

**8.** (i) (අ) "සම්මුඛ පරීක්ෂණ ක්‍රමය සේවකයින් තෝරාගැනීම සඳහා භාවිත කරන ජනප්‍රිය ක්‍රමයකි."
මෙම ක්‍රමයේ ඇති සීමා **දෙකක්** විස්තර කරන්න.

- සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පක්ෂපාතී වීම වැනි ඌනතා නිසා යෝග්‍යතම පුද්ගලයන් තෝරාගැනීමට නොහැකි වීම.
- අයදුම්කරු තුළ අනියත බියක් ඇතිවීම.
- අයදුම්කරු මවාගත් ප්‍රතිරූපයක් දක්වීම / අපේක්ෂකයා ව්‍යාජ ලෙස හැසිරීමට උත්සාහ ගැනීම.
- පිරිවැය අධික වීම.
- වැඩි කාලයක් වැය වීම.

*(ලකුණු 1* **x 2** = *ලකුණු 02)*

(ආ) පරිවාස කාලය තුළ තමන් වෙත පවරන ලද රාජකාරී හා වගකීම් ඉටු කිරීමට අපොහොසත් සේවකයකුට විරුද්ධව කළමනාකරණයට ගත හැකි ක්‍රියාමාර්ග **හතරක්** සඳහන් කරන්න.

i. වාචිකව හා ලිඛිතව අවවාද කිරීම

ii. පරිවාස කාලය දීර්ඝ කිරීම

iii. සේවකයා වෙනත් අංශයකට මාරු කිරීම

iv. සේවය අවසන් කිරීම

*(ක්‍රියාමාර්ග 4 ට ලකුණු ½ x 4 = ලකුණු 02)*

(ii) සංවිධානයක මුදල් ගලා යාම් පාලනය කළ හැකි ආකාර **හතරක්** යෝජනා කරන්න.

i. එදිනෙදා ගෙවීම් ප්‍රමාද කිරීම

ii. ලාභාංශ රඳවා ගැනීම

iii. ණය ප්‍රාග්ධනය ලබා ගැනීම සීමා කිරීම මගින් පොළී හා ලාභාංශ ගලායාම පාලනය කිරීම

iv. අතිරික්ත සේවකයන් රඳවා නොගැනීම තුළින් සේවක පිරිවැය පාලනය කිරීම

v. ආයතන හා පරිපාලන (හා විකුණුම්) වියදම් අවම කිරීම

vi. අවශ්‍යතාවයට ගැළපෙන පරිදි පමණක් තොග මිල දී ගැනීම

*(කරුණු 4 ට ලකුණු 1 x 4 = ලකුණු 04)*

(iii) (අ) සංවිධානයක් සඳහා තොරතුරු කළමනාකරණයේ ඇති වැදගත්කම කෙටියෙන් පැහැදිලි කරන්න.

- එක් එක් අංශ ඒකාබද්ධ කිරීමට.
- ප්‍රතිපෝෂණය ලබා දීමට.
- පාරිභෝගික සම්බන්ධතා වර්ධනය කරගැනීමට.
- සේවක සබඳතා වර්ධනය කරගැනීමට.
- නීති බලගැන්වීමට.
- නවෝත්පාදන වර්ධනය කරගැනීමට.
- තීරණ ගැනීමට පහසුවීම

*(ලකුණු 1 x 2 = ලකුණු 02)*

(ආ) ව්‍යාපාරිකයකුට ව්‍යාපාර සැලැස්මක් වැදගත් වීමට හේතු **දෙකක්** කෙටියෙන් විස්තර කරන්න.

1. ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාම සඳහා මගපෙන්වීමට.
2. ව්‍යාපාර කෙරෙහි ඇල්මැති පාර්ශ්වයන්ට ව්‍යාපාරය පිළිබඳ අවබෝධයක් ලබාදීමට.
3. ව්‍යාපාරයට අවශ්‍ය මූල්‍ය පහසුකම් ලබාගැනීමට.
4. ව්‍යාපාරය කරගෙන යාමේදී ඇතිවිය හැකි ගැටළු විසඳාගැනීමට.
5. මිශ්‍ර ආයෝජකයින් ආකර්ෂණය කරගැනීමට

*(ලකුණු 1 x 2 = ලකුණු 02)*

(iv) (අ) අලෙවි සැලැස්මක ඇතුළත් විය යුතු මූලිකාංග පැහැදිලි කරන්න.

- කර්මාන්තය හා වෙළෙඳපොල විශ්ලේෂණය.
- අලෙවි කිරීමට අපේක්ෂිත භාණ්ඩය හා සේවාව.
- ඉලක්ක වෙළෙඳපොල.
- තරඟකාරී විශ්ලේෂනය.
- අපේක්ෂිත අලෙවිය.
- තරඟකරුවන්ගේ අලෙවි උපාය මාර්ග.
- ව්‍යවසායකයාගේ යෝජිත අලෙවි උපාය මාර්ග.
- විකුණුම් පුරෝකථනය.
- අලෙවි වියදම්.

*(ලකුණු ½ x 4 = ලකුණු 02)*

(ආ) තරගකාරිත්ව විශ්ලේෂණයේ දී අවධානය යොමු කළ යුතු සාධක **හතරක්** ලියන්න.

- පවත්නා තරඟකාරිත්වය.
- තරඟකරුවන් හා ඔවුන්ගේ ශක්තීන්.
- තරඟකාරිත්වයට මුහුණ දීමට ඔහු සතු ශක්තීන් හා දුර්වලතා.
- වෙළෙඳපොලට පිවිසීමට ඇති බාධා, එනම් පිරිවැය, කාලය, තාක්ෂණය, පවතින පේටන්ට් බලපත්‍ර හා වෙළෙඳ ලකුණ ආදිය.

*(ලකුණු ½ x 4 = ලකුණු 02)*

(v) ඇස්තමේන්තුගත ව්‍යාපෘති පිරිවැය තුළ අඩංගු වන 'මෙහෙයුම් පෙර වියදම්' යන්න පැහැදිලි කර, ඒ සඳහා උදාහරණ **දෙකක්** ලියන්න.

මෙහෙයුම් පෙර වියදම් යනු ව්‍යාපාරයක කටයුතු ආරම්භ කිරීමට පෙර අවශ්‍යවන වියදම්ය.

*( ලකුණු 02)*

උදාහරණ -

ඉඩම් සංවර්ධන වියදම්

විදුලිය හා ජල පහසුකම් ලබා ගැනීමට දරන වියදම

බලපත්‍ර ලබාගැනීමට දරන වියදම

*(ලකුණු 1 x 2 = ලකුණු 02)*

# උසස් පෙළ සඳහා ග්‍රන්ථ නාමාවලිය

## (අ.පො.ස) උසස් පෙළ

## 12-13 ශ්‍රේණි - කෙටි සටහන්

**සිංහල මාධ්‍ය**

### විද්‍යා - ගණිත

- 12 සාමාන්‍ය තොරතුරු තාක්ෂණය
- 12-13 රසායන විද්‍යාව - 1
- 12-13 රසායන විද්‍යාව - 2
- 12-13 රසායන විද්‍යාව - 3
- 12-13 රසායන විද්‍යාව - 4
- 12-13 රසායන විද්‍යාව - 5
- 12-13 භෞතික විද්‍යාව - 1
- 12-13 භෞතික විද්‍යාව - 2
- 12-13 භෞතික විද්‍යාව - 3
- 12-13 භෞතික විද්‍යාව - 4
- 12-13 භෞතික විද්‍යාව - 5
- 12-13 ජීව විද්‍යාව - 1
- 12-13 ජීව විද්‍යාව - 2
- 12-13 ජීව විද්‍යාව - 3
- 12-13 ජීව විද්‍යාව - 4
- 12-13 ජීව විද්‍යාව - 5
- 12-13 ජීව විද්‍යාව - 6 (ක්‍රියාකාරී මානවයා)
- 12-13 ජීව විද්‍යාව - 7 (ක්‍රියාකාරී ශාකය)
- 12-13 කෘෂි විද්‍යාව - 1
- 12-13 කෘෂි විද්‍යාව - 2
- 12-13 කෘෂි විද්‍යාව - 3
- 12-13 කෘෂි විද්‍යාව - 4

### වාණිජ්‍යය

- 12 ගිණුම්කරණය
- 13 ගිණුම්කරණය
- 12 ව්‍යාපාර අධ්‍යයනය
- 13 ව්‍යාපාර අධ්‍යයනය
- 12 ආර්ථික විද්‍යාව
- 13 ආර්ථික විද්‍යාව - 1
- 13 ආර්ථික විද්‍යාව - 2

### කලා

- 12 සිංහල
- 13 සිංහල
- 12 දේශපාලන විද්‍යාව
- 13 දේශපාලන විද්‍යාව
- 12 ශ්‍රී ලංකා ඉතිහාසය
- 13 ශ්‍රී ලංකා ඉතිහාසය
- 12 ඉන්දියානු ඉතිහාසය
- 13 ඉන්දියානු ඉතිහාසය
- 12 භූගෝල විද්‍යාව
- 13 භූගෝල විද්‍යාව
- 12 බෞද්ධ ශිෂ්ටාචාරය
- 13 බෞද්ධ ශිෂ්ටාචාරය
- 12 සන්නිවේදන හා මාධ්‍ය අධ්‍යයනය
- 13 සන්නිවේදන හා මාධ්‍ය අධ්‍යයනය

## Grade 12-13 - Short Notes

**English Medium**

- 12 Accounting
- 13 Accounting
- 12 Business Studies
- 13 Business Studies
- 12 Eeonomics

## 12-13 ශ්‍රේණි - ප්‍රශ්නෝත්තර

**සිංහල මාධ්‍ය**

- සාමාන්‍ය දැනීම
- 12 ගිණුම්කරණය - 1
- 12 ව්‍යාපාර අධ්‍යයනය
- 12 ආර්ථික විද්‍යාව

සියලු ම ශ්‍රේණි සඳහා කෙටි සටහන් සහ ප්‍රශ්න පත්‍ර පොත් අප සතුව තිබෙන අතර, මෙම ඕනෑම ග්‍රන්ථයක් වට්ටම් සහිත ව ඔබේ නිවසට ම ගෙන්වා ගත හැකි ය.